# තවත් සඳක් බැස යයි

## සෝමවීර සේනානායක ගුණ සුවඳ

ශ්‍රී ලාංකික සිංහල සාහිත්‍ය කලා සාරත්වයට සිය දිවිය පුරා තම නිර්මාණ උල්පතෙහි සාරය මුසු කිරීම සඳහා පන්හිඳ මෙහෙය වූ තවත් උත්කෘෂ්ඨවත් ප්‍රාඥයක කලාකරුවකු මාධ්‍යවේදියකු ලේඛකයකු නොබෝ ද අප සාහිත අඹරෙන් නිහඬව බැස ගියේ ය. වසර 74 ක කාලයක තුළ වෙනත් කිසිම රැකියාවක නොරැඳී විවිධ ක්ෂේත්‍ර ඔස්සේ තමා ප්‍රගුණ කළ ශිල්ප ශාස්ත්‍ර ඔහු ප්‍රතිනිර්මානය කලේ භාෂා සහ ලේඛන කලාවේ ප්‍රවර්ධනය සඳහාම වීම ඔහුගේ සුවිශේෂි ලක්ෂණය විය. ඔහු නමින් සෝමවීර සේනානායකයන්ය. ඔහු වඩා ප්‍රකට වූයේ නූතන සිංහල සාහිත්‍යයේ පශ්චාත් කාලයේ නවකතාව, කෙටි කතාව, සිනමා තිර රචනය, ටෙලි නාට්‍ය රචනය, විචාර කලාව ආදී සෑම ක්ෂේත්‍රයකින්ම මිනිස් දිවියේ හර පද්ධතීන් සියුම් ලෙස ස්පර්ශ කල නිර්මාණකරුවන් අතර ප්‍රමුඛයෙකු ලෙසිනි.

1944 දී කෑගල්ල දිස්ත්‍රික්කයේ උඩගම නම් හද්දපිටිසර ගම් ප්‍රදේශයක උපත ලබා එම ගැමි සුන්දරත්වයට ජීවන ගමනට ආලෝකය කරගත්, විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසු එකී සෞන්දර්යය තම ප්‍රතිභානය සමඟ මුසුකිරීමට ගත් උත්සාහය තම නිර්මාණ සාර්තකත්වයට පාදක කරගත් බවත් ඔහුගේ නිර්මාණවලින් පසක් වෙයි.

විශ්ව විද්‍යාලයෙන් පිටවන විටම ඔහුට ලේක්හවුස් ආයතනයේ උපකතු තනතුරකට ආරාධනා ලැබෙන්නේ ඒවන විටත් ඔහුගේ කෙටිකතා, සාහිත්‍ය ලිපි සමාජ පිළිගැනීමකට ලක් වී තිබීම නිසාය. ඔහු 1969 දී තම ප්‍රථම නවකතාව වන "ආදරයට බය මිනිස්සු" නිර්මාණයේ සෞන්දර්යයෙන්ම පාඨකයා වෙතට සමීප වූයේ ය. මවකගේ ගීතය, යශෝරාවය, ඉර හඳ පායන ලෝකය, අඳුරට පහනක්, පංච වරුණ, මැණික් නදිය ගලා බසී, එක්ටැම් ගෙවල්, බලදේවගේ ලෝකය, අඹු සැමියෝ, මතු දවසක වැනි ඔහුගේ සෑම නවකතාවක් ම පාහේ පාඨක රසිකයන්ගේ විමසුමට ලක්විනි. ඔහුගේ නව කතාවල ජීවත් වූ චරිත තම ගැමි චින්තනය ඔස්සේ ගොඩ නැගූ යතාර්ථවාදී මනුෂ්‍ය ලක්ෂණ වලින් සරසා තිබීම ඊට හේතුවිය. ඒ අතරින් "යශෝරාවය" නවකතාව, රාජ්‍ය සම්මානයට පවා ලක්වූයේ ශ්‍රී ලාංකික ටෙලි නාට්‍ය ඉතිහාසයේ අතිශය ජනප්‍රිය ටෙලි නිර්මාණයක් බවට පත්වෙමිනි. "බලදේවගේ ලෝකය" යශෝරාවයේ දෙවන කොටස ලෙස නිර්මාණවන්නේ ද එහි ප්‍රතිඵලයක් වශයෙනි.

නවකතා නිර්මාණ අභිබවා ඔහු සිත්ගත් ටෙලි නාට්‍ය රචකයෙකු බවට පත්වන්නේ සමකාලීන සමාජ සන්දර්භයන්හි යතාර්ථය උපහාසාත්මකව සරදමට ලක්කල ආකෘතික සෞන්දර්යය හේතු කොට ගෙනය. ශ්‍රී ලාංකික ටෙලි නාටක සාහිත්‍යයේ ආරම්භක ප්‍රබල නිර්මාණය වූ ඔහුගේ යශෝරාවය, පළිඟු මැණිකේ, නෑදෑයෝ, අසල් වැසියෝ, කන්දෙ ගෙදර අදටත් ප්‍රේක්ෂකයින්ගේ මතකයේ රැඳී ඇති මාතෘ නිර්මාණයන් ය. යශෝරාවය ඔහුගේ ශාස්ත්‍රපති උපාධිය සඳහා රචිත නිබන්ධනය වූ අතර, එය ඔහුගේ ප්‍රථම ටෙලි නාට්‍ය ද විය. ඔහු අතින් රචිත ටෙලි නාට්‍ය 30 කට අධිකය. චිත්‍රපට රචකයෙකු වශයෙන් ද ඔහුගේ නිර්මාණ සම්මානයට ලක්වුනි. මිහිදුම් සිහින, ආරාධනා හා ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් අධ්‍යක්ෂණය කළ "අම්මාවරුනේ" ඒ අතර රසික ප්‍රසාදයට ලක්විය. සාහිත්‍ය කලාවේ මෙම ධාරාවන්ට අමතරව, ඔහු විසින් රචිත බෞද්ධාගමික සන්දර්භයෙන් යුත් "සිත නිවන කතා හා සංසාරේ පිය සටහන්" රූපාවාහිනී වැඩ සටහන් ද බෞද්ධ ප්‍රබෝධයට හේතු විය.

ළමා පරපුර වෙනුවෙන් ද තම සාහිත්‍ය නිපුණතාව දායාද කිරීමට ඔහු අමතක නොකළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස රචනා කළ "අපූරු ගමේ පොඩි ඇත්තෝ රජකා ලේ පුංචි ළමයි දඩමං ඔස්සේ ගග අද්දර කැලේ සතුන් අතර බෝසත්වරු" වැනි කථා පොත් හඳුන්වා දිය හැක. ගග අද්දර කැලේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වය ටම නැගීමට තරම් එය හරවත් විය. මෙම නිර්මාණ ඇතුළු විවිධ ශාස්ත්‍රීය හා විචාර ග්‍රන්ථ 35 ක් පමණ අනාගත පරපුරට දායාද කර අපෙන් සමුගත් සෝමවීර සේනානායකය න්ට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතු ය. ඔහුට නිවන් සුව පතමු.



විජේරත්න පතිරාජ
බාහිර කථිකාචාර්ය
ශ්‍රීපාලි මණ්ඩපය කොළඹ විශ්ව විද්‍යාලය

Cartoon By Shanika Somatilake




